# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2270/33 - 2022 මාර්තු මස 10 වැනි බ්‍රහස්පතින්දා - 2022.03.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය :* WGSWD&EIP/ACQ/KB/35.
*ඉඩම අමාත්‍යාංශයේ යොමු අංකය :* 4/3/10/2015/LRB/196

වේරස් ගඟ වැසි ජලය අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ, අංක 15/25, 2 වන පටුමග, පැපිළියාන මාවත, කොහුවල දරන ස්ථානයේ සිට අංක 327/2, රණසිංහ මාවත, පැපිළියාන, බොරලැස්ගමුව දරන නිවසට යාබදව පිහිටි දෙපා ඇළ මාර්ගය සංවර්ධනය කිරීම හා ඇළ මාර්ගයේ නඩත්තු මාර්ගය සකස් කිරීම සඳහා ඉඩම් කොටස් රජයට පවරාගෙන ඇති බැව් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තිය (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*පවරා ගන්නා ලද ඉඩමේ විස්තර* :

කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, පැපිළියාන (කැස්බෑව නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කර ඇති අංක 9741 හා 2019.07.23 දිනැති මූලික පිඹුරේ පෙන්වා ඇති, පහත අංකනය කර ඇති බිම් කොටස්.

01. **කැබලි අංකය 01**
ඉඩමේ නම : සොයාගත නොහැක; විස්තරය: ඇළ; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: සොයාගත නොහැක; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 0.0083.

02. **කැබලි අංකය 02**
ඉඩමේ නම : මාදංගහ ඕවිට; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: එම්. දිසානායක මයා, අංක 87, පැපිළියාන, බොරලැස්ගමුව; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 0.0087.

03. **කැබලි අංකය 03**
ඉඩමේ නම : වරිපනම් අංකය 15/19, සුනේත්‍රාදේවී පාර, දෙවන පටුමඟ; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක සහ තාවකාලික ගොඩනැගිල්ලක කොටස් සහ වැසිකිලි වලක් ඇත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: ඩබ්. ජිනදාස මයා, අංක 15/19, දෙවන පටුමග, පැපිළියාන, නුගේගොඩ; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 0.0047.

04. **කැබලි අංකය 04**
ඉඩමේ නම : වරිපන්ම් අංක 107/1, දෙහිවල පාර; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් සහ වැසිකිලියක කොටසක් ඇත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: ජී. සමරනායක මයා, අංක 107/1, දෙහිවල පාර, පැපිළියාන, බොරලැස්ගමුව; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 0.0083.

05. **කැබලි අංකය 05**
ඉඩමේ නම : සොයාගත නොහැක; විස්තරය: සිමෙන්ති කානුව; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: සොයාගත නොහැක; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 0.0004.

06. **කැබලි අංකය 06**
ඉඩමේ නම : වරිපනම් අංකය 87, පැපිළියාන පාර; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: එම්. දිසානායක මයා, අංක 87, පැපිළියාන, බොරලැස්ගමුව; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 0.0040.


1A - G36303 – 27 (2022/02)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 මාර්තු මස 22 වැනි දින පෙ. ව. 10.00 ට රාජගිරිය, ජයවර්ධනපුර මාවතේ, අංක 03 දරන ස්ථානයේ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ පිහිටි ඉඩම් අත්කර ගැනීමේ කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2022 මාර්තු මස 15 වැනි දිනට මත්තෙන් එම ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

එච්. තිලකවර්ධන,
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි
වේරස් ගඟ වැසි ජලය අපවහන හා
පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය
කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2022 මාර්තු මස 08 වැනි දින,
වේරස් ගඟ වැසි ජලය අපවහන හා
පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය
අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

EOG 3 - 0813

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.